# දුම්රිය පාලකවරුන්ගේ සංගමය

# RAILWAY TRAIN CONTROLLERS' UNION

**NO. 377/30/1/2, RAILWAY PASSAGE, MARADANA ROAD,**

**COLOMBO 10, REG NO. 5623**

| PRESIDENT : | SECRETARY | TREASURER |
|---|---|---|
| Dheeshana Patabendige | M.A.C.Jayaroshan | B.D.J.M.Nanayakkara |
| Tel : 071-9340262 | Tel : 071-4403607 | Tel :071-3428036 |
| Tel : 011-2692606 | Tel : 011-2692606 | Tel :011-2692606 |


03.09.2026

අතිගරු ජනාධිපති,

අනුර කුමාර දිසානායක මැතිතුමා,

ජනාධිපති කාර්යාලය,

කොළඹ 01.

**<u>දුම්රිය ඒකාබද්ධ වෘත්තීය සමිති සන්ධානය මගින් 17.09.2026 දින පැය 00.00 සිට ක්‍රියාත්මක කිරීමට නියමිත සංකේත වැඩ වර්ජනය සඳහා සහය පළ කිරීම.</u>**

මෙම වෘත්තිය සමිති ක්‍රියාමාර්ගය නිශ්චිත කරුණු දෙකක් අරඹයා ක්‍රියාත්මක කිරීමට නියමිතය. එනම්,

1. දුම්රිය ස්ථානාධිපති සංගමයේ ලේකම් වරයාගෙන් කැඳවා ඇති නිදහසට කරුණු විමසීම වහාම සහ කොන්දේසි විරහිතව ඉවත් කර ගැනීම

2. වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරී වරයා එම තනතුරින් ඉවත් කිරීම.

වර්තමාන දුම්රිය සාමාන්‍යාධිකාරී වරයාගේ දරදඬු හැසිරීම සම්බන්ධව අප සංගමයේ සාමාජිකයන් අතරද පවතින්නේ යහපත් ආකල්පක් නොවේ.

දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධිය සඳහා කිසිඳු සාධනීය පියවරක් ගන්නා බවක් නොපෙන්වන දුම්රිය සාමාන්‍යාධිකාරී වරයා, මගීන් හා වත්මන් ආණ්ඩුවද අපහසුතාවයට පත්වන අයුරින් සහ වෘත්තිය සමිති මුළුමනින්ම නොසලකා හරිමින් වැඩවසම් පන්නයේ පාලනයක් ගෙන යාමට උත්සාහ කරන බව අපගේ අදහසයි.

ඒබැවින් ඉහතින් සඳහන් කරන ලද සංකේත වැඩවර්ජනය සඳහා අප සංගමයේද සහය දක්වමින් 17.09.2026 දින පැය 00.00 ට පෙර පිළිගත හැකි විසඳුමක් නොලැබුනහොත් පැය 48ක කාලයක් සේවයෙන් ඉවත් වී සිටීමට තීරණය කල බව මෙමගින් දැනුම් දෙමු.

අපගේ අරමුණ කිසිසේත්ම රජය අපහසුතාවයට පත් කිරිම නොවන බැවින් මෙම වැඩ වර්ජනය ප්‍රකාශිත අරමුණින් අපගමනය වන බවක් ( දේශපාලනමය හෝ වෙනත් පාර්ශවයක බලපෑමකට ලක්වීම වැනි) පෙන්නුම් කලහොත් මෙම ක්‍රියාමාර්ගයෙන් ඉවත්ව සේවයට වාර්තා කරන බව වැඩිදුරටත් දන්වා සිටීමට කැමැත්තෙමු.

..................................

එම්. ඒ. සී. ජයරෝෂන්

ලේකම්

දුම්රිය පාලකවරුන්ගේ සංගමය

ලි.ස.අ. 5623

පිටපත්

ගරු අග්‍රාමාත්‍ය හරිණි අමරසූරිය මෙනවිය

ජනාධිපති ලේකම් - ජනාධිපති කාර්යාලය

අග්‍රාමාත්‍ය ලේකම් - අග්‍රාමාත්‍ය කාර්යාලය

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය තුමා

ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය තුමා

ලේකම් ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය

දුම්රිය සාමාන්‍යාධිකාරී

අතිරේක සාමාන්‍යාධිකාරී (මෙහෙයුම්)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ගමනාගමන/වාණිජ)

අධිකාරී (ගමනාගමන/වාණිජ)

නියොජ්‍ය අධිකාරී(ගමනාගමන) - කොළඹ/අනුරාධපුර/නාවලපිටිය

ලේකම් දුම්රිය ස්ථානාධිපති සංගමය